කඩිනමින් ප්‍රකාශයට පත්කිරීම සඳහා **:** 2019 ඔක්තෝබර් 9

*වැඩිදුර තොරතුරු සඳහා සම්බන්ධ කරගන්න***:**

ක්ලේටන් මැක්ක්ලැස්කි, දුරකතනය: +1 202-728-5429, විද්‍යුත් තැපෑල : cmccleskey@ndi.org

**අන්තර්ජාතික ජනරජ ආයතනයෙහි සහ ජාතික ප්‍රජාතන්ත්‍රවාදී ආයතනයෙහි ඒකාබද්ධ දූත පිරිස විසින් නොවැම්බර් 16 වන දින පැවැත්වෙන ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරණය සම්බන්ධයෙන් නිර්දේශයන් ඉදිරිපත් කරනු ලබයි**

අන්තර්ජාතික ජනරජ ආයතනය - International Republican Institute (IRI) හා ජාතික ප්‍රජාතන්ත්‍රවාදී ආයතනය - National Democratic Institute (NDI) විසින් සංවිධානය කළ අන්තර්ජාතික ඒකාබද්ධ පූර්ව මැතිවරණ දූත පිරිස විසින් නොවැම්බර් 16 වන දින පැවැත්වෙන ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරණය සම්බන්ධයෙන් ස්වකීය දූත මෙහෙයෙන් ඉස්මතු වූ කරුණු පිළිබඳව නිවේදනයක් ඉදිරිපත් කරනු ලදි. එම නිවේදනය දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් ද ලබාගත හැකිය.

වර්ෂ 2019 සැප්තැම්බර් 30 වන දින සිට ඔක්තොම්බර් 04 වන දින දක්වා කාල පරාසය තුල මෙකී ඒකාබද්ධ දූත පිරිස විසින්: දේශපාලන ක්ෂේත්‍රයෙහි සභිකයින්: මැතිවරණ කොමිෂන් සභාවේනියෝජිතයින්: පාර්ලිමේන්තු සභිකයින්: රජයේ නිළධාරීන්: පුරවැසි මැතිවරණ නිරීක්ෂණ ආයතනයන්හි නියෝජිතයින්: කාන්තා දේශපාලනික ක්‍රියාකාරීන්: මාධ්‍ය හා සම්බන්ධ සංවිධානයන්හි නියෝජිතයින් ද ඇතුළුව සිවිල් සමාජ නියෝජිතයින්ව හමුවන ලදි. මෙකී රැස්වීම් සහ ක්ෂේත්‍රයෙහි සිදු කරන ලද නිරීක්ෂයන් පදනම් කරගනිමින් මැතිවරණ ක්‍රියාවලියෙහි විනිවිදභාවය, සුරක්ෂිතභාවය සහ විශ්වාසනීයත්වය මෙන්ම මහජන විශ්වාසය තවදුරටත් ශක්තිමත් කිරීම උදෙසා උපකාරී වන නිර්දේශයන් දූත පිරිසෙහි නිවේදනය මගින් ඉදිරිපත් කෙරේ.

මූලික නිර්දේශයන් සඳහා පහත සඳහන් කරුණු අන්තර්ගත වේ:

- **මාධ්‍ය පක්ෂග්‍රාහීත්වය:** මැතිවරණ ප්‍රචාරණ ව්‍යාපාරය පවතින කාලය තුළ, මුද්‍රිත, විද්‍යුත් විකාශන සහ සමාජ මාධ්‍ය ජාලා මෙන්ම මැතිවරණ අපේක්ෂකයින් සහ සමාජ මාධ්‍ය ජාලා මෙන්ම මැතිවරණ අපේක්ෂයින් සහ ඔවුන්ගේ ආධාරකරුවන් විසින් ප්‍රචාරණය සඳහා භාවිතා කරනු ලබන දෑ සම්බන්ධයෙන් වගකීමක් සහ ආචාර ධර්ම වලට අනුකූල මාධ්‍ය හැසිරවීමක් සඳහා අවශ්‍ය මාර්ගෝපදේශයන් කඩිනමින් ඇති කිරීම මැතිවරණ කොමිසම විසින් කළ යුතු වේ.

විශේෂයෙන්ම අපක්ෂපාතී සහ සාධාරණ මාධ්‍ය ආවරණයක් සියලුම මැතිවරණ අපේක්ෂකයින්ට ලබා දීම සම්බන්ධයෙන් ගත් කළ, ඉහත කී මාර්ගෝපදේශයන්ට අනුකූලව රාජ්‍ය මෙන්ම පෞද්ගලික මාධ්‍ය ආයතන ද කටයුතු කල යුතු වේ. මෙම ජනාධිපතිවරණයෙන් පසුව, අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිවාසිකම් සහ තොරතුරු ලබා ගැනීමේ ප්‍රවේශය තහවුරු කරන අතරටම පුද්ගලික මාධ්‍ය හරහා වෛරී කථනය, සාවද්‍ය තොරතුරු සහ අසත්‍ය ප්‍රචාරයන් ආදිය පාලනය කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව සමඟ එක්ව පර්ලිමේන්තුව විසින් අදාළ නෛතික ප්‍රතිපාදන සැකසීම සම්බන්ධයෙන් සලකා බැලිය යුතුය.

- **මැතිවරණ වියදම්:**මැතිවරණ ක්‍රියාවලියෙහි විනිවිදිභාවය ඉහළ නැංවීමටත් වඩාත් දැන් උගත් තෝරාගැනීමක් කිරීම සඳහා පුරවැසියන්ට බලගැන්වීමටත්, මැතිවරණ අපේක්ෂකයින් විසින් මැතිවරණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන වත්කම් සහ බැරකම් ප්‍රකාශ ප්‍රසිද්ධ කළ යුතු වේ. දිගු කාලීන පියවරක් වශයෙන්, මැතිවරණ වියදම් සීමාවන්, වාර්තාකරණය සහ විදේශ දායකත්වයන් ආදිය සම්බන්ධයෙන් ඇති ප්‍රශ්නය පාර්ලිමේන්තුව විසින් විසඳාලීමට අවශ්‍ය කටයුතු කල යුතු වේ.

- **ඡන්ද දායකයින් දැනුවත් කිරීම:** විශේයෙන්ම මනාප ඡන්ද ක්‍රමය සහ ඡන්දය ලකුණු කිරීම සම්බන්ධයෙන් ඡන්දදායකයින් සතු දැනුම ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් වැඩි වශයෙන් සිදු කිරීමට මැතිවරණ කොමිසම , දේශපාලන පක්ෂ, මාධ්‍ය සහ සිවිල් සමාජය විසින් කටයුතු කල යුතුය. කාන්තාවන්, තරුණ ජන කොටස් සහ ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වන ජනතාව ඉලක්ක කරගනිමින් කෙරෙන ඡන්ද දැයකයින්ගේ දැනුම ඉහළ නැංවීමේ වැඩසටහන්වල වර්ධනයක් විය යුතු අතර සෑම පුරවැසියෙකුගේම ඡන්දයෙහි වටිනාකම, මැතිවරණ ආරවුල් නිරවුල් කිරීමේ යාන්ත්‍රණයන්ට සඳහා ඇති ප්‍රවේශය සහ අනුග්‍රහය ආදී කරුණු කෙරෙහි ඇති වැදගත්කම අවධාරණය කල යුතුය.

- **ආචාරධර්ම පද්ධතිය:**යහපත් භාවතයන්ට අනුරූප වන පරිදි සහ උද්ගතවිය හැකි ප්‍රචණ්ඩත්වයන් මෙන්ම සාවද්‍ය තොරතුරු, අසත්‍ය ප්‍රචාර සහ වෛරී කථනයන් මැඩපැවැත්වීමට උපකාරී වන්නා වුත්, මැතිවරණ කොමිසම මගින් පහසුකම් සලසා බලාත්මක කිරීම සිදු කිරීමට හැකි වන්නාවුත් ස්වේච්ඡා බහු පක්ෂ ආචාර ධර්ම පද්ධතියකට එකග වීමට ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ විසින් පියවර ගත යුතුය.

මෙකී නිර්දේශයන් මගින් අපේක්ෂා කරණු ලබන්නේ, ඉදිරියේ පැවැත්වීමට නියමිත මැතිවරණයේදී ශ්‍රී ලංකාවට මුහුණ දීමට සිදුවන මූලික අභියෝගයන් වන, මනාප ඡන්දය ලබාදීමේ ක්‍රමවේදය අවබෝධ කරගැනීම, කාන්තාවන් සහ අනෙකුත් ආන්තික කණ්ඩායම් වලට පූර්ණ වශයෙන් සහභි වීමට ඇති බධාවන්, පක්ෂග්‍රාහී මාධ්‍ය ආවරණයන් සහ මැතිවරණ වියදම් සම්බන්ධයෙන් ප්‍රමාණවත් නීති නොමැතිකම ආදී තත්ත්වයන් ආමන්ත්‍රනය කිරීමය.

දූත පිරිසෙහි ප්‍රධානී, එකසත් ජනපද රාජය දෙපාර්තමේන්තුවෙහි දකුණු ආසියානු කටයුතු පිළිබඳ හිටපු සහකාර රාජ්‍ය ලේකම්, තානාපති කාල් ඉන්ඩෆර්ත් ප්‍රකාශ කරන ලද්දේ ,"රටේ ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධයෙන් වන අනාගත දිශානතිය තීරණය කිරීමට තරම් හැකියාවක් ඇති මට්ටමේ අතිශයින්ම වැදගත් ජාතික මට්ටමේ මැතිවරණයකට ශ්‍රී ලංකාව මුහුණ දී සිටී" යනුවෙනි. "ශ්‍රී ලංකාව තුල දිගු කාලීන උත්සහයක් දැරූසමගිය බිඳදැමීමට යම් තර්ජනාත්මක තත්වයක් වර්ෂ 2019 අප්‍රේල් මස සිදු වූ පාස්කු

ඉරිදා ප්‍රහාරය මඟින් සිදුවිය. බහුවිධතාවය සහ සාමකාමී සහජීවනය වෙනුවෙන් දැක් වූ කැපවීමතවදුරටත් ශක්තිමත් කිරීම සඳහා අවස්ථාවක් මෙම මැතිවරනය තුලින් ලැබී තිබේ."

දූත පිරිසට නායකත්වය දුන් දේශපාලන සහ හමුදාමය කටයුතු පිළිබඳ හිටපු නියෝජ්‍ය සහකාර රාජ්‍ය ලේකම් කාරා බියු විසින් ප්‍රකාශ කරන ලද්දේ, "සාමය සහ අනාගත අභිවෘද්ධිය සඳහා ඉතා වැදගත් වන බහුවිධතාවය සහ විවිධත්වය යළි තහවුරු කිරීම සඳහා ඉදිරියට ඒමට ඇති සුවිශේෂී අවස්ථාවක් මෙම මැතිවරණයෙන් ශ්‍රී ලංකාවට ලැබී ඇත" යනුවෙනි. "ඉදිරි මැතිවරණයන්හිදී දේශපාලන නායකත්ව තනතුරු සඳහා කාන්තාවන්ට වැඩි අවස්ථාවන් හිමි වන තත්ත්වයක් අත්දැකීමටද අප අපේක්ෂා කරමු."

අන්තර්ජාතික ජනරජ ආයතනයෙහි සහ ජාතික ප්‍රජාතන්ත්‍රවාදී ආයතනයෙහි එකාබද්ධ දූත පිරිස විසින් මෙම දූත මෙහෙය සිදුකරන ලද්දේ අන්තර්ජාතික මැතිවරණ නිරීක්ෂණය සඳහා වන මූලධර්ම පිළිබඳ ප්‍රකාශනයට Declaration of Principles for International Election Observation අනුකූලව වන අතර, ශ්‍රී ලංකාවේ මැතිවරණයන්හි විශ්වාසනීයත්වය සහ සුජාතභාවය මෙන්ම තමන්ගේ රටෙහි ප්‍රජාතාන්ත්‍රික සංවර්ධනය පිළිබඳ නිෂ්චය කිරීම ශ්‍රී ලංකාකික ජනතාව විසින් සිදුකරනු ඇති බව මෙහිලා පිළිගනී.

අන්තර්ජාතික ජනරජ ආයතනයෙහි සහ ජාතික ප්‍රජාතන්ත්‍රවාදී ආයතනයෙහි දූත පිරිස අතරට, තානාපති ඉන්ඩෆර්ත් සහ බියු ට අමතරව, මලයාසියානු පාර්ලිමේන්තු සභික ගරු මාරියා චින් අබ්දුල්ලාඉන්දියානු මැතිවරණ කොමිෂන් සභාවේ හිටපු සභාපති එස්. වයි. ක්වරයිෂි මහතාජාතික ප්‍රජාතන්ත්‍රවාදී ආයතනයෙහි ආසියානු සහ පැසිපික් කලාපය සඳහා කලාපීය අධ්‍යක්ෂක මන්ප්‍රීට් සිං ආනන්ද් මහතා සහ අන්තර්ජාතික ජනරජ ආයතනයෙහි වැඩසටහන් පිළිබඳ උප සභාපති ස්කොට් මැස්ටික් මහතා යන නියෝජිතයින් ද ඇතුලත් විය.

මෙම මාධ්‍ය නිවේදනය දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් බලන්න.

###

***ජාතික ප්‍රජාතන්ත්‍රවාදී ආයතනය*** *-* ***National Democratic Institute*** *(NDI) වූ කලී ආණ්ඩු පාලනය තුලපුරවැසි සහභාගීත්වය, විවෘතභාවය සහ වගවීම හරහා ලෝකය පුරාවට පැතිරී පවතින ප්‍රජාතන්ත්‍රවාදී ආයතනයන් ශක්තිමත් කිරීමට සහ ඒවාට සහයෝගය ලබා දීම සඳහා කැප වූ ලාභ නොලබන අපක්ෂපාතී සංවිධානයක් වේ. වැඩිදුර තොරතුරු සඳහා*

*www.ndi.org.*

***අන්තර්ජාතික ජනරජ ආයතනය - International Republican Institute*** *(IRI) වූ කලී ආණ්ඩු කාන්තාවන් සහ තරුණයින්ද ඇතුළුව, දේශපාලන ක්‍රියාවලිය තු ආන්තික ජන කණ්ඩායම්හි කාර්යභාරය ඉහල දැමීම සඳහා සහ විනිවිදභාවයකින් සහ වගවීමකින් යුත් පාලන ක්‍රමයන් ශක්තිමත් කිරීම සඳහා දේශපාලන පක්ෂ වලට උපකාර කිරීම ඔස්සේ ලෝකය පුරාවට නිදහස සහ ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රවර්දනය කිරීම උදෙසා කැප වූ ලාභ නොලබන අපක්ෂපාතී සංවිධානයක් වේ. වැඩිදුර තොරතුරු සඳහා*

*www.iri.org.*